# සමාජ විද්‍යා තරඟාවලිය-2023

**අකුරැස්ස අධ්‍යාපන කලාපය**

**පාසල් කාණ්ඩය :- 200ට අඩු/201-500/501-1000/1000ට වැඩි**

**ශ්‍රේණිය :- 6**

**කාලය :- පැය 01 මිනිත්තු 30යි.**

01. පොළොන්නරුව ගල් විහාරය ඉදිකරන ලද්දේ කුමන රජතුමා විසින් ද?

1. දුටු ගැමුණු රජතුමා 2. මහසෙන් රජතුමා 3. I පරාක්‍රමබාහු රජතුමා 4. සිගිරි කාශ්‍යප රජතුමා

02. ඉතිහාසය ඉගැනීමට ප්‍රයෝජනවත් වන සාහිත්‍ය මූලාශය කුමක් ද?

1. ගොඩනැගිලි 2. පැරණි පොත්පත් 3. පැරණි කාලයට අයත් භාණ්ඩ 4.කාසි

03. ශත වර්ෂ ක්‍රමය ආරම්භ වන්නේ කුමන රටේද?

1. ශ්‍රී ලංකාව 2. ඉන්දියාව 3. නේපාලය 4. අරාබිය

04. හැකි මිනිසා ලෙස හඳුන් වන්නේ කවුද?

1. ඔස්ට්‍රොලොපිතිකස් 2. හෝමෝ හැබිලස්

3. හෝමෝ ඉරෙක්ටස් 4. හෝමෝ නියැන්ඩතාලන්සිස්

05. ඔබේ පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය කුමක් ද?

1. දිස්ත්‍රක්කය 2. ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසය

3. පළාත 4. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය

06. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් අයත් වන පළාත වන්නේ කුමක් ද?

1. උතුරු පළාත 2. නැගෙනහිර පළාත 3. වයඹ පළාත 4. ඌව පළාත

07. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටා ඇත්තේ කොහේද?

1. ගාල්ල 2. කොළඹ 3. අම්පාර 4. මහනුවර

08. පාසල පාලනය සම්බන්ධ ප්‍රධාන නිලය කුමක්ද?

1. අංශප්‍රධාන 2. නියෝජ්‍ය විදුහල්පති 3.ගුරුවරු 4. විදුහල්පති

09. තමා සතු දක්ෂතාවයක් වන්නේ මින් කුමක්ද?

1. ඉවසීම නොමැතිකම 2. ගීත ගායනය 3. කේන්තිය 4. අලසකම

10. පාසලේ අනන්‍යතාව පෙන්නුම් කරන සංකේතයක් නොවන්නේ මින් කුමක්ද?

1. පාසල් ගීතය 2. පාසලේ ආදර්ශ පාඨය

3. ජාතික කොඩිය 4. පාසල් ලාංඡනය

- හරි (✓) වැරදි (✗) යොදන්න.

11. මාලිමා යන්ත්‍රය ලොවට හඳුන්වා දුන්නේ චීන ශිෂ්ටාචාරයෙනි. (     )

12. මහාමාරියා බල්ලාගෙන් ඇති වන රෝගයකි. (     )

13. මෙරුවා, වැහිලිහිණියා කාලගුණික පෙරනිමිති දන්වන සතුන් වේ. (     )

14. ජලය ස්වභාවික සම්පතක් නොවේ. (     )

15. සැලසුම් සහගත ශිෂ්‍යයා කාලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගනී (     )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

16. පෘථිවියේ අධික ශීතල දේශගුණයක් පැවති කාලය හඳුන්වන්නේ ............................ යුගය යනුවෙනි.

17. ........................ දිශාව දකුණු හා බස්නාහිර අතර පිහිටා ඇත.

18. යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුල පවතින වායු ගෝලයේ ස්වභාවය ........................ ලෙස හැඳින් වේ.

19. පාසලට ළමුන් ඇතුළත් කර ගැනීම .................................... යනුවෙන් හැඳින්වේ.

20. ඉතිහාසය ගැන අපට තොරතුරු ලබා දෙන්නට උපයෝගි වන සෑම දෙයක්ම හැඳින්වීමට යොදන පොදු නම ........................ ලෙස හැඳින් වේ.

- 21 සිට 25 දක්වා රූපය බලා පිළිතුරු ලියන්න.

21. 

I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

II. මෙය සොයා ගත්තේ කුමන රටකින්ද?

22. 

I. මෙම රූපයෙන් දැක්වෙන උපකරණය කුමක්ද?

II. එය සාදන ලද්දේ කුමන අමුද්‍රව්‍යකින්ද?

23. 


I. මෙම රූපයෙන් දැක්වෙන උපකරණය කුමක්ද?

II. මෙම උපකරණය සඳහා යොදා ගන්නා මිනුම් ඒකකය කුමක්ද?

24. 

I. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

II.ඔහු හැඳින් වූ විරුදානාමය කුමක්ද?

25. 

I. මෙම රූපයේ දැක්වෙන මානව සම්පත කුමක්ද?

II. මෙම මානව සම්පතින් ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න.

(4×5=20)

- අංක 26 සිට 30 දක්වා ඇති පිළිතුරු ලියන්න.

26. I. ඉතිහාසය ඉගෙනීමට ඉවහල් වන මූලාශ්‍ර වර්ග 2 නම් කරන්න.

II. ඔබ පාසලේ ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන මූලාශ්‍ර 3ක් නම් කරන්න.

27. I. හින්දුවරුන් සහ මුස්ලිම්වරුන් වැඩි වශයෙන් භාවිතා කරන වර්ෂ ක්‍රම අනුපිළිවෙලින් ලියන්න.

II. පහත සඳහන් සිදුවීම් සිදු වූ වර්ෂ ක්‍රි.ව.වලින් ලියන්න.

A. ශ්‍රී ලංකාවට නිදහස ලැබූ වර්ෂය -
B. ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිදු වූ වර්ෂය -
C. මහසෙන් රජුගේ කාලය ආරම්භ වීම සිදු වූ වර්ෂය -

28. I. කාලගුණික අංග 2ක් නම් කරන්න.


II. කාලගුණික තොරතුරු ප්‍රයෝජනවත් වන පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න.

29. I. ශාකයකින් ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

II. පහත සඳහන් සතුන්ගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජනය බැගින් ලියන්න.

A. කපුටා
B. ඇටි කුකුළා
C. ගැඩවිල් පණුවා

30. පහත රූපයේ දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකකයන්ය. ඒවා හඳුනාගෙන නම් කරන්න.



ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත ස්ථාන ලකුණු කොට නම් කරන්න.


31. කොළඹ

32. පොළොන්නරුව

33. මාතර

34. මහවැලි ගංගාව

35. ත්‍රිකුණාමලය



LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**